# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2067/17 - 2018 අප්‍රේල් මස 19 වැනි බ්‍රහස්පතින්දා - 2018.04.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**එල්.ඩී.බී. 21/1978 (x)**

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25 අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍ය කබීර් හෂීම් වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කොට ඇති සමාගමක් වන ලියාපදිංචි අංක පී.බී. 4833 දරන නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් සම්බන්ධයෙන් ඉහත කී විශ්වවිද්‍යාල පනතේ 70 ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසු, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදනු ලැබූ 2018 ජනවාරි මස 11 වැනි දින අංක 2093/40 දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද නියමයේ II වන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන ''පරිගණක පද්ධති ඉංජිනේරු පිළිබඳ විද්‍යාවේදී ගෞරව'' යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිවම මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව සඳහන් සටහන් මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත්ව එකතු කිරීම මගින් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

කබීර් හෂීම්,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය

2018 අප්‍රේල් මස 18 වැනි දින,
කොළඹ දී ය.

I වන උපලේඛනය

*කොන්දේසි*

නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් උපාධි වැඩසටහන් සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී -

(අ) අභ්‍යන්තර නිර්මාණවේදය උපාධිය සම්බන්ධයෙන්, අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී කවර හෝ විෂය ධාරාවකින් 'S' සාමාර්ථ තුනක් (03) එකවර ලබා තිබීම යන අවම ඇතුළත් කරගැනීමේ සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන්නට අනුකූල විය යුතු ය.

1A - PG 3997- 507 (2018/04)

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(ආ) පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ පරිගණක ජාලකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය සම්බන්ධයෙන් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී භෞතීය විද්‍යා විෂය ධාරාවෙන් 'S' සාමාර්ථ තුනක් (03) එකවර ලබාතිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන්නට අනුකූල විය යුතු ය.

## II වන උපලේඛනය

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| අභ්‍යන්තර නිර්මාණවේදය | බීඅයිඑන්ටීඩීඑස් |
| පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී | බීඑස්සීසීඑස් |
| පරිගණක ජාලකරණය පිළිබඳ විද්‍යාවේදී | බීඑස්සීසීඑන් |

05 - 41

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.